වෙන්ගලාචෙඩිකුලම් ප්‍රාදේශීය සභාව
වවුනියාව දිස්ත්‍රික්කය
-----------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 21 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ඔක්තෝබර් 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට වෙන්ගලාචෙඩිකුලම් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 ගිණුම් ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සභාවේ ආරම්භක ශේෂ වල වත්කම් පහක වටිනාකම දක්වා තිබුණද භෞතිකව එම වත්කම් නොතිබුණි. වර්ෂය අවසානයට වූ ශේෂ වලද මෙම වත්කම් වල වටිනාකම දක්වා තිබුණි. එබැවින් 2015 දෙසැම්බර් 31 දිනට වත්කම්වල වටිනාකම රු. 9,772,052 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) නීති වියදම් වශයෙන් රු. 173,400 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුල ගෙවා තිබුණද එම වියදම් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඇ) පෙර වර්ෂවලට අදාල විවිධ ණය හිමියෝ, කල් ඉකුත් වූ තැන්පතු, උසාවි දඩ, මුද්දර බදු සහ පොලී ආදායම් සමුච්චිත අරමුදල් ගිණුමට ගලපනවා වෙනුවට ජර්නල් සටහන් මගින් සංචිත ගිණුමට ගලපා තිබුණි.

1.3.2 ලැබිය යුතු ගිණුම්

---------------------

(අ) ලැබිය යුතුව ඇති රු. 43,700 ක ආයුර්වේද පරිත්‍යාග ලබා ගැනීම් සඳහා වර්ෂ 12 කට වැඩි කාලයක සිට කටයුතු කර නොතිබුණි.

1.3.3 නීති, රීති, රෙගුලාසි ආදියට අනුකූල නොවීම

--------------------------------------------------

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවූ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන පරිපලන චක්‍රලේඛය. | මාස 06 කට වතාවක් ඉන්ධන ටැංකිය පුරවා ධාවනයේ යොදවා ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂා කළ යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති V අධිකාරය රීති 7 | අභ්‍යන්තර විගණන අංශයක් ක්‍රියාකර නොතිබුණි. |
| (ඇ) | 2011 නොවැම්බර් 26 දිනැති අංක 454 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වාහනවල දුම් පරීක්ෂාව සිදුකර අදාල ආයතනවලින් සහතික ලබාගත යුතුය. කෙසේ වුවද, සභාවේ වාහන 04 ක් සම්බන්ධයෙන් එම ක්‍රියා පරිපාටිය අනුගමනය කර නොතිබූ අතර බදු සහතිකද සමාලෝචිත වර්ෂයට ලබා ගෙන නොතිබුණි. |
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12 කොටස | රු. 25,000 ඉක්මවන කොන්ත්‍රාත් වැඩ හා සේවා ගෙවීම් සම්බන්ධයෙන් රඳවා ගැනීමේ බදු ගෙවීම පිළිබඳව විගණකාධිපතිටද පිටපතක් සහිතව දේශීය ආදායම් බදු කොමසාරිස් වරයා වෙත එළඹෙන මාසයේ 15 දිනට පෙර දැන්විය යුතුය. රු. 1,282,361 ක් වූ සභාව විසින් ගෙවා ඇති රඳවා ගැනීමේ බදු සම්බන්ධයෙන් වූ පිටපත සමාලෝචිත වර්ෂය තුලදී විගණකාධිපතිට යවා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
-------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵලය

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් අතිරික්තය රු. 7,189,187 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම් ඉක්මවූ පුනරාවර්තන වියදම් අතිරික්තය රු. 1,741,748 විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය රු. 5,447,439 ක් විය.

2.2.1 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

------------------------------------------

ආදායම් ඇස්තමේන්තු නිසි පරිදි සකස් කර නොතිබූ අතර ඇස්තමේන්තු නිසි පරිදි සැලසුම් කර වැඩ සටහන් ගත කර නොතිබුණි. තවද අයවැය ගත ආදායම් සහ තත්‍ය ආදායම් අතර විචලනයන් විගණනයේදී නිරීක්ෂණය විය.

2.2.2 උසාවි දඩ මුදල්
-------------------

2015 දෙසැම්බර් 31 දිනට උතුරු පළාත් ප්‍රාධාන ලේකම්වරයාගෙන් අයවිය යුතුව ඇති රු. 2,815,954 ක උසාවි දඩ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන තොතිබුණි.

2.2.3 මුද්දර ගාස්තු
----------------

2011 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය වෙනුවෙන් ඉඩම් රෙජිස්ටාර් ජනරාල්ගෙන් ලැබිය යුතුව ඇති රු. 2,169,110 ක මුද්දර ගාස්තු ද අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.2.4 හිඟ බදු
----------

1996 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා බදු කර දෙකක් වෙනුවෙන් ලැබිය යුතුව ඇති රු. 93,889 ක හිඟ බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.3 මෙහෙයුම් සමාලෝචනය
-------------------------------

2.3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා
--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ නියමයන් ප්‍රකාරව දීර්ඝ කාලයක් නිශ්ක්‍රීයව පවතින සභාවේ වාහන 06 ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) වාහන 17 ක හිමිකම සභාව සතුව නොතිබුණද ඒවායේ හිමිකම සභාවට පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) රු. 2,500,000 ක මුදලක් ආදේශක සංචිතයක තිබියදී සමාලෝචිත වර්ෂ තුලදී රු. 4,500,000 ක මුදලක් ආදේශක සංචිතයට මාරු කර තිබුණි. ආදේශක සංචිතයේ අරමුණු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.3.2 මානව සම්පත් කළමනාකරණය
----------------------------------

2015 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තත්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 66 සහ 49 ක් විය. පුරප්පාඩු කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව 17 ක් බව විගණනයට නිරීක්ෂණය විය.

2.3.3 විගණන හා කළමනාකරණ කමිටු
----------------------------------------

සභාවේ කටයුතු කාර්යක්ෂමව කරගෙන යාම සඳහා විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතුය. එසේ වුවද සමාලෝචිත වර්ෂය තුලදී විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

2.3.4 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත වත්කම්
-------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දින සියයේ වැඩ සටහන යටතේ රු. 977,704 ක ඇස්තමේන්තුවකට අරසඩිකුලම් ක්‍රීඩා ගාරය ඉදිකර තිබුණද 2016 ජූනි 11 දිනටද එය නිෂ්ක්‍රීයව පැවැතුණු බවට නිරීක්ෂණය විය.

(ආ) 2015 වර්ෂයේදී විදුලි උත්පාදක යන්ත්‍රයක් මිලදීගැනීම සඳහා රු. 888,000 ක මුදලක් වියදම් කර තිබුණද මෙම වාර්තාවේ දිනය දක්වා එය නිෂ්ක්‍රීයව පැවතුණි.

4. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

i. ආදායම් රැස්කිරීම

ii. ස්ථාවර වත්කම්

iii. අත්තිකාරම්

iv. ප්‍රාග්ධන වැඩ

v. ප්‍රධාන ලෙජර් නඩත්තුව